**ශීර්ෂය 122 - පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

**-----------------------------------------------------------------------------------------------------------------**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

**----------------------------------------------------------------------------------------------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

**----------------------**

ශීර්ෂය 122 - පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.20 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි හා ගණන් දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| 127(1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරු වන පරිදි සියලු මූල්‍ය කාර්යයන් සැලසුම් කළයුතු වීම. (දෙපාර්තමේන්තු කටයුතු සිදුකළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තු වන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව. ) | 1. ප්‍රසම්පාදන කටයුතු සැලසුම් නොකිරීම- ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම. | 2.2.1 |
| | | 2. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු. | 2.11 |
| | | 3. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.14 |
| 127(1) (ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලසෙන ක්‍රමයක් සම්පාදනය කළයුතු වීම. | 1.කළමනාකරණ අඩුපාඩු | 2.7 |
| | | 2. විසඳා නොතිබුණු විගණන ඡේද | 2.6 |
| | | 3. අනුකූල නොවීම් | 2.15 |

| | | | |
|---|---|---|---|
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අලුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සකසුරුවම්කම හා කාර්යක්ෂමතාව අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1.ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු.<br>2.අනාර්ථික ගනුදෙනු | 2.2.2<br>2.5 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්ථතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළහැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියලු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වන ආකාරයක් සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු<br>2. වත්කම් ඌන උපයෝජනය- නිෂ්ක්‍රීයව පැවතීම. | 2.3 (අ)<br>2.3 (ආ) |
| 127(4) | තමාගේ එක් එක් ගණන් දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධි වූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | 1. වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම.<br>2. අග්‍රිම ගිණුමේ අඩුපාඩු.<br>3. පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු .<br>4. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු | 2.1.1 (අ)<br>2.11<br>2.12<br>2.13 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම. | 2.8 (අ) (i) |
| 127(6) | ගණන් දීමේ නිලධාරියාගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම. | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු .<br>2.රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9<br>2.10 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යභාරයන් 16 ක් ඉටුකළ යුතුව තිබුණත් ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය දැක්වෙන ප්‍රගති වාර්තාව විගණනය වෙත 2018 ඔක්තෝබර් 26 දින ඉදිරිපත් කරන ලදී. එබැවින් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන්ගේ කාර්යසාධනය ඇගයීමට නොහැකි විය.

(ආ) අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් අනුමැතිය ලබා ගත් ඉදිකිරීමක් 2017 වර්ෂයේදී ආරම්භ කිරීමට ප්‍රතිපාදන සලසා තිබුණද 2018 මැයි 10 වන විටත් ඉදි කිරීමට අදාළව ලංසු කැඳවීම පමණක් සිදු කර තිබුණි.

### 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

#### 2.2.1 ප්‍රසම්පාදන සැලසුම් කිරීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටුකර ගැනීම සඳහා රු.මිලියන 127.8 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 74.8 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදන සම්බන්ධයෙන් පිළියෙල කළයුතු වූ ප්‍රසම්පාදන සැලස්ම චක්‍රලේඛ ප්‍රකාරව පිළියෙළ කර නොතිබූ අතර විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන සකස්කර නොතිබුණි.

#### 2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම.

"Buddhist Ideals of Good Governance" ග්‍රන්ථය එළිදැක්වීමේ උත්සවය කළමනාකරණය හා සංවිධානය කිරීම. තරඟකාරී මිල කැඳවීමකින් තොරව රු.3,300,175 කට සැලසිනේ රූපවාහිනී ආයතනයට ලබා දී තිබුණි. මෙම කාර්යය වීඩියෝ ගත කිරීමට ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට ලබා දීමට අමාත්‍යාංශ සහකාර ලේකම් තීරණය කර තිබියදී හා මුදල් ගෙවීමකින් තොරව ලබා ගත හැකිව තිබියදී එය සැලසිනේ ආයතනයට ලබා දී රු. 175,000 ගෙවා තිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

-----------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාහන උපයෝජනය**

-----------------------

ඉන්ධන දහනය වීම පරීක්ෂා නොකිරීම

------------------------------------------

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සතුව පැවති වාහන 27 හි ඉන්ධන දහනය වීම පරීක්ෂා කර නොතිබුණි.

**(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

වටිනාකම රු.14,276,500 ක් වූ වාහන හතරක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අමාත්‍යාංශ භූමියේ ගාල් කොට තිබුණි.

**(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

------------------------------------------

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද්දේ මාස 06 ක ප්‍රමාදය සහිතව 2018 සැප්තැම්බර් 12 දින ය.

**(ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

------------------------------------------------------------------------

2015 වර්ෂයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් අමාත්‍යාංශයට ලබා දී තිබූ අතර 2016 වර්ෂයේ අනතුරකට භාජනය වී තිබුණද 2018 ඔක්තෝබර් වන විටත් අලුත් වැඩියා කර භාවිතයට ගෙන නොතිබුණි. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් වාහනය නැවත ලබා දෙන ලෙස ඉල්ලුම් කර තිබුණතද එය ලබා දීමට කටයුතු කර නොතිබුණි.

**2.4 බැඳීම් හා බැරකම්**

----------------------

**බැරකම් නිරවුල් නොකිරීම**

------------------------------

විසර්ජන ගිණුමේ දක්වා තිබූ එකතුව රු.12,623,443 ක බැරකම් විගණිත දිනය වූ මැයි 18 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 2.5 අනාර්ථික ගනුදෙනු

----------------------

අමාත්‍යාංශ සෝපානය සවිකරීම හා ගොඩනැගිලි රාමුව සකස් කිරීම සඳහා රු.6,963,652 ක් වැයකර තිබුණ ද සෝපාන ඉදිකර වසර 05 ක් වැනි කෙටි කාලයකින් කඩා වැටී මේ අවදානමට ලක්වීම නිසා රු.1,603,850 ක පිරිවැයක් දරා 2018 ජනවාරි මාසයේ එය කඩා ඉවත් කර තිබුණි. තවද, කඩා ඉවත් කරන ලද සෝපානය කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අමාත්‍යාංශ භූමියේ 2018 විගණිත දින වන විටත් තිබුණි.

## 2.6 විසදා නොතිබුණි විගණන ඡේද

-----------------------------------

අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද | |
| 2012 | 8 (ආ)(ii) | රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානය සඳහා වෙනම පනතක් සැකසීම. |
| 2012 | 12 (අ) | රන්මිහිතැන්නට නිකුත් කළ ප්‍රවේශපත් හා ලැබූ ආදායම අතර වූ රු.99,305 ක ඌනතාවය. |
| 2012 | 12(ඒ) | 2012 වර්ෂයේදී නිම කිරීමට යෝජිත ජනමාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහය. |
| 2012 | 1.13(ඇ) | ගුවන් විදුලි සහ රූපවාහිනී නාලිකා පවත්වා ගැනීමට බලපත්‍ර නිකුත් කිරීමේදී, ස්ථිර බලපත්‍ර වෙනුවට තාවකාලික බලපත්‍ර නිකුත් කිරීමෙන් ඇති වූ දුර්වලතා. |
| 2014 | 3.16 (අ) | කේබල් රූපවාහිනි සඳහා බලපත්‍ර 2012 වර්ෂයේදි ලබාගත් ආයතනයක් නීතිවිරෝධී ආකාරයට කටයුතු කිරීම. |
| 2015 | 3.14 (ආ) (ii) | අමාත්‍යවරයාගේ ධූර කාලයට පමණක් වලංගු වන පරිදි සහකාර ලේකම් තනතුරට පත්කරනු ලැබ සිටි නිලධාරියාට අමාත්‍යවරයාගේ ධූරය අහෝසි වීමෙන් පසු සේවය කළ කාලයට ගෙවන ලද වැටුප් හා දීමනාවලින් තව දුරටත් අය කර ගත යුතු රු. 84,131 අය කර ගෙන නොතිබුණි. |
| 2015 | 3.18 (අ) | අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් මාසයේදී රු. 648,312 ක් වැයකර ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳව "FRONTIER" නමින් සඟරා පිටපත් 1,000 ක් මුද්‍රණය කිරීම. |

| | | |
|---|---|---|
| 2015 | 3.19 (ඇ) | තනතුරෙහි ස්ථිර කර නොමැති අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය) තනතුරේ සිටින නිලධාරියාට සුදුසුකම් නොතිබියදී සහනදායී මෝටර් රථ බලපත්‍රයක් ලබාදීම. |

**2.7** **කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

නියදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) 2015 වර්ෂයේ පැවති රූපවාහිනී නාලිකා බදු නොගෙවා විකාශනය කරන ආනයනික ටෙලිනාට්‍ය හා චිත්‍රපට වැඩසටහන් හඳුනාගෙන බදු අයකිරීමේ ක්‍රමවේදය 2015 වර්ෂයේ පරිගණක පද්ධතිය අක්‍රිය වීම නිසා නවතා තිබුණි. 2017 වර්ෂයේ එය නැවත ආරම්භ කර තිබුණු අතර ආනයනික වෙළඳ දැන්වීම් විකාශනය කරන අවස්ථා හඳුනාගෙන තිබුණ ද, ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන පරීක්ෂණයකදී අනාවරණය වී තිබූ අමාත්‍යාංශයේ ජනමාධ්‍ය අංශයේ තොග ගබඩාවේ රු. 1,150,791 ක ලිපි ද්‍රව්‍ය වංචාව සම්බන්ධයෙන් විමර්ශන කර ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට සහ පාඩුව පියවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) 2015 හා 2016 වර්ෂවල අනතුරට ලක්ව තිබූ වාහන 2 ක් නැවත අලුත්වැඩියා කර ප්‍රයෝජනයට නොගෙන 2018 වර්ෂය දක්වාම පැවතුණි.

**2.8** **කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

**----------------------------------------------------------------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| 2013 | පුනරාවර්තන | 400,630,000 | 368,032,490 | 32,597,510 | 8.14 |
| | මූලධන | 1,236,370,000 | 959,320,403 | 277,049,597 | 22.41 |
| | එකතුව | 1,637,000,000 | 1,327,352,893 | 309,647,107 | 18.92 |
| 2014 | පුනරාවර්තන | 459,809,000 | 448,986,044 | 10,822,956 | 2.35 |
| | මූලධන | 823,241,000 | 599,338,577 | 223,902,423 | 27.20 |
| | එකතුව | 1,283,050,000 | 1,048,324,621 | 234,725,379 | 18.29 |
| 2015 | පුනරාවර්තන | 1,114,800,000 | 1,055,120,851 | 59,679,149 | 5.35 |
| | මූලධන | 2,411,500,000 | 323,671,898 | 2,087,828,102 | 86.58 |
| | එකතුව | 3,526,300,000 | 1,378,792,749 | 2,147,507,251 | 60.90 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 1,255,175,112 | 1,218,208,461 | 36,966,651 | 2.95 |
| | මූලධන | 2,148,380,000 | 284,108,960 | 1,864,271,310 | 86.78 |
| | එකතුව | 3,403,555,112 | 1,502,317,151 | 1,901,237,961 | 55.86 |
| 2017 | පුනරාවර්තන | 1,490,106,000 | 1,369,578,812 | 120,527,188 | 8.09 |
| | මූලධන | 2,330,459,170 | 332,886,486 | 1,997,572,684 | 85.72 |
| | එකතුව | 3,820,565,170 | 1,702,465,298 | 2,118,099,872 | 55.44 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) විසර්ජන ගිණුම**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම.**

**-----------------------------------------------------------**

(i) වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 1,859.3 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

(ii) භෞමික රූපවාහිනී විකාශන කටයුතු සඳහා අංකන තාක්ෂණය හඳුන්වා දීමේ ව්‍යාපෘතිය, ක්‍රියාත්මක කිරීම සඳහා විදේශ මූල්‍යාන ආශ්‍රිත දේශීය පිරිවැය හා විදේශ ණය 2016 සහ 2017 වර්ෂවල රු.මිලියන 1,698 ක වැය ඇස්තමේන්තුවලට සහ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණ ද, විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 10 දින වන විටත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

**2.9 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

**---------------------------------------**

**10.02.13.00 දරන ආදායම් සංකේතය - ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද**

**---------------------------------------------------------------------------------**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017 අගෝස්තු 16 දිනැති අංක 01/2015 (ix) දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය මගින් 2017 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියෝග නිකුත් කර තිබුණි. එසේ වුවද 2017 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා එකතු කළ ආදායම රු.131,138,481 ක්, 2017 ජූනි සිට අගෝස්තු දක්වා ශුද්ධ ආදායම රු.61,890,236 ක් හා 2017 වර්ෂයේ කල්පිරුණු භාණ්ඩාගාර බිල්පත් වටිනාකම වූ රු. 391,680,019 ක් ඇතුළුව එකතුව රු.584,708,736 ක් ද ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(ii) 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය පෞද්ගලික මාධ්‍ය ආයතන 02 කින් අයවිය යුතු වූ රු.46,847,381 ක් වූ හිඟ බදු ආදායම් සමාලෝචිත වර්ෂය අවසානයට ද අයකර ගෙන නොතිබූ අතර ආදායම් ගිණුමේ පෙර වර්ෂ හිඟ ආදායම් ලෙස දක්වා නොතිබුණි.

## 2.10 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

---

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

---

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 12201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| 24,000,000 | 16,152,383 | 8,000,000 | 14,414,536 | 50,000,000 | 32,290,898 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 හා 2017 වර්ෂ වල සේවය අතහැර ගොස් තිබූ සේවකයන් 2 කුගෙන් අයවිය යුතු රු.203,534 ක ණය ශේෂ විගණිත දිනය වූ 2018 ජූලි 17 වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) 2004 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශවලට ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, එසේ කටයුතු නොකර රු. 429,802 ක ණය ශේෂ අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

## 2.11 අග්‍රිම ගිණුම්

---

2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 128 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු.2,315,159 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාස 01 සිට මාස 11 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් එම අග්‍රිම නිරවුල් කර තිබුණි.

## 2.12 පොදු තැන්පත් ගිණුම

---

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 107.65 ක් විය. මුළු එකතුව රු.මිලියන 2.84 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු 2 ක් සම්බන්ධයෙන් මු.රෙ.571 හි (3) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට විගණිත දින වූ 2018 මැයි 18 වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2.13 බැංකු ගිණුම් මෙහෙයවීම

---

නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 06 ඉකුත් රු.255,542 ක් වටිනා චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මු.රෙ.396 (ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.14 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

**-----------------------------------------------**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීවකනව පවත්වා නොතිබුණු බව නියදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | හානි හා පාඩු පිළිබඳ ලේඛනය | මු.රෙ.110 | යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි |
| (ii) | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛන | පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (iii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත් කාලීනව පවත්වාගෙන ගොස් නොතිබූ අතර වත්කම් අත්පත් කර ගත් දිනය, වටිනාකම ආදී මූලික තොරතුරු ද ඇතුළත් කර නොතිබුණි. |
| (iv) | වට්ටෝරු ලේඛනය | | යාවත් කාලීනව පවත්වාගෙන ගොස් නොතිබූ අතර වෙන්දේසි කළ හා ඉවත් කරන ලද භාණ්ඩ බඩු වට්ටෝරු පොතේ ඇතුළත්ව තිබුණි. |

**2.15 නීති, රීති රෙගුලාසි වලට අනුකූල නොවීම**

**-----------------------------------------------**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රය** | |
| මුදල් රෙගුලාසි 104(1) සහ 105(4) | 2017 වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 09 ක් හා 2015 හා 2016 වර්ෂ වල සිදු වූ වාහන අනතුරු 2 ක් සම්බන්ධව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර වගකීම් පැවරී ඇති නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

**(ආ) 2006 අංක 11 දරන මුදල් පනත**

--------------------------------

| | |
|---|---|
| 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව සකස් කර 2017 නොවැම්බර් 07 දිනැති අංක 2044/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝග මාලාවේ 7.2.(ආ) වන උප නියෝගය | බලපත්‍රලාභියාට නම් කළ හැක්කේ තවත් එක් බලපත්‍රලාභී ආයතනයක් වුවද පළමු බලපත්‍රලාභියා විසින් බලපත්‍රලාභී ආයතන කිහිපයක් නම් කර තිබුණු අතර අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සියලුම බලපත්‍රලාභී ආයතනවලට එම වැඩසටහන විකාශනය කළ හැකි වන පරිදි නිෂ්කාශන සහතික නිකුත්කර තිබුණි. |

## 2.16 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

### 2.16.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

----------------------------------------------------------------------------------------------

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 123.5 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.504,475 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 14 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 70 | 58 | 12 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 32 | 23 | 09 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | 02 | 18 | - | 16 |
| | | 123 | 114 | 25 | 16 |